# සංස්කෘතික පුරාණය

1995 ජනවාරි - මාර්තු

♦ 1 වෙළුම
12 කලාපය

♦ සංස්කාරක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ටී. ජී. කුලතුංග

♦ ඔබේ ලිපි පහත සඳහන් ලිපිනයට එවන්න:
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
මධ්‍යම සංස්කෘතික අරමුදල,
212/1, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

# අලකොළවැව ලෙන්විහාරයේ චිත්‍ර

–අනුර මනතුංග

මහනුවර යුගයේ ගැමි සිත්තරෙකුගේ කාර්යයට නිදසුන් කොට දැක්විය හැකි දුර්ලභ ගණයේ චිත්‍ර පැවති ස්ථානයක් ලෙස අලකොළවැව ලෙන් විහාරය හැඳින්විය හැකිය. බොහෝ කලක් වනගතව ජරාවාසව පැවති මේ ලෙන් විහාරය ප්‍රතිසංස්කරණය කොට නැවත භික්ෂුවාස කිරීම සඳහා එහි චිත්‍ර සහිත පැරණි බිත්ති සියල්ල අවට ගැමියන් විසින් මෑත දී කඩා බිඳ දමා ඇත. එම විනාශය සිදුවීමට වසර කීපයකට පෙර එනම් 1983 වසරේ දී අලකොළවැව ලෙන්විහාරය පිළිබඳව වාර්තාවක් ලිවීමටත්, එහි චිත්‍රවල කටුසටහන් ඇඳ ගැනීමටත් මේ ලේඛකයා සමත් විය. මෙතෙක් අමුද්‍රිතව පැවති එම විස්තර ආශ්‍රයෙන් මේ ලිපිය ලිවීමට මා අදහස් කළේ අලකොළවැව චිත්‍ර පිළිබඳව දැනගැනීම සඳහා අද ඉතිරිව ඇති එකම විස්තරය ප්‍රසිද්ධියට පත්කළ යුතු යැයි හැඟුණු නිසා ය.

මාතලේ දිස්ත්‍රික්කයේ ඉනාමළුව කෝරළයේ අලකොළවැව ගමට කිලෝ මීටරයක් පමණ ගිණිකොන දිගින් මේ ලෙන් විහාරය පිහිටියේ ය. පැරණි ස්මාරක නාමාවලියේ 'අලකොළවැව ලෙන් විහාරය' නමින් සඳහන් කොට ඇති එය අවට ගම්වාසීන් විසින් හඳුන්වනු ලබන්නේ 'කොට්ටදැමුහෙළ ගල්වැටේ පන්සල' යනුවෙනි. නැගෙනහිර දෙසට මුණලා පිහිටි කුඩා ලෙන් විහාරයක් වන මෙය උතුරේ සිට දකුණට මීටර් 10 ක් පමණ දිග අතර නැගෙනහිර සිට බටහිරට මීටර් 5 ක් පමණ උපරිම පළලකින් යුක්තය. වරිච්චි බිත්තියෙන් බඳින ලද කුඩා කුටි දෙකක් එතුළ පිහිටා ඇත. ඒ අතරින් තරමක් විශාල වූ දකුණින් පිහිටි කුටිය මෙම ලෙන් විහාරයේ පිළිමගෙය ලෙසට භාවිතා වූ බවට සාධක ඇත. එයට යාව උතුරින් පිහිටි අනෙක් කුටිය ආවාස කුටියක් බව පැහිදිලිය. මුලින් කී කුටියේ දැනට ඉතිරිව ඇත්තේ උතුරු සහ දකුණු බිත්ති දෙක පමණක් වන අතර අනෙක් කුටියේ බිත්ති තුනම තවමත් හොඳින් ආරක්ෂා වී ඇත.

ආවාස කුටියේ බිත්තිවල සිතුවම් කිසිවක් දක්නට නොමැත. එහෙත් පිළිමගෙයි බිත්තිවල ඇතුල් පැත්තේ සුදුහුණු ආලේප කර ඒ මත සිතුවම් ඇඳ ඇත. එහි දකුණු බිත්තියේ ඉහළින් සිතුවම් තීරුවක බුද්ධ රූප දෙකක් ඉතිරිව ඇති අතර උතුරු බිත්තියේ බුද්ධ රූප සහිත සිතුවම් තීරුවක් හැරුණු විට වෙස්සන්තර ජාතකය දැක්වෙන සිතුවම් තීරු 3 ක් ද දුටුව හැකිය.

මෙම සිතුවම් මහනුවර අවධියේ ප්‍රචලිත වූ සිතුවම් ශෛලියට අනුවඇඳ ඇත. ඒවා එකල විසූ නූගත් සිත්තරකු විසින් අඳින ලද බව සිතිය හැකි ය. මූලික වශයෙන් මේවා කළු පැහැයෙන් අඳින ලද රේඛා සිතුවම් ය. එහෙත් මෙහි ඇති ඇතැම් රූපවල කළු හැරුණු විට රතු සහ කහ පැහැයෙන් ද සුළු වශයෙන් ආලේපයක් වශයෙන් යොදා ඇත.

මේවා ඇඳ ඇත්තේ තීරු ක්‍රමයට ය. එම සිතුවම් තීරු බෙහෙවින් පටුය. දකුණු බිත්තයේ බුද්ධ රූප සහිත සිතුවම් තීරුව සෙ.මී. 3ක් පමණ පළල අතර අනෙකුත් සිතුවම් තීරු ඊට බෙහෙවින් පටුය. උතුරු බිත්තියේ බුද්ධ රූප සහිත සිතුවම් තීරුවේ පළල සෙ.මී. 25 ක් පමණය. පළල සෙ.මී. 16ක් පමණ වන අතර එහි ඇති මිනිස් රූප සියල්ලම සෙ.මී. 10 ට වඩා උසින් අඩුය.

මේ බිත්තිවල ඉහළම තීරුවෙන් බුද්ධරූප දැක්වීමෙන් අදහස් කරන්නට ඇත්තේ සූවිසි බුදුවරුන් නිරූපණය කිරීම විය හැකිය. එහෙත් ඒ අතරින් දැනට දක්නට ඇත්තේ දකුණු බිත්තියේ බුද්ධරූප දෙකකුත් උතුරු බිත්තියේ බුද්ධරූප හතරකුත් තවත් රූප කීපයකට අයත් කොටස් කීපයකුත් පමණ ය. එම බිත්ති දෙකෙහිම බුද්ධරූපවල ප්‍රමාණයෙන් ඇති වෙනස්කම හැරුණු විට වෙනත් විශේෂ වෙනසක් දුටුව නොහැකි ය. සියළුම බුදුවරුන් ධ්‍යාන මුද්‍රාවෙන් යුක්තව ආසනයක් මත ඉඳගෙන සිටින ආකාරයෙන් මෙහි දක්වා ඇත. බුද්ධ රූප දෙකක් අතර සිටගෙන බුදුන් වහන්සේට වැඳගෙන සිටින භික්ෂු රුවක්ද එහි සිත්තම් කර ඇත. බුදුන් වහන්සේගේ සිරුර වටා මෙන් ම මෙම භික්ෂුන්ගේ ශීර්ෂයන් වටා ද රැස්වළල්ල දුටුව හැකිය. ඔවුන්ගේ චීවරය දික් අතට සහ හරස් අතට යෙදුනු රැලි රේඛාවලින් ඇඳ දක්වා ඇත. බුදුන් වහන්සේ වැඩ සිටින ආසනය පළාපෙති සහ මල් මෝස්තරයක් සහිත ය. උතුරු බිත්තියේ පමණක් බුද්ධ රූප සහිත සිතුවම් තීරුව සහ පහතින් ඇති තීරුව අතර කොටසක් පළාපෙති සහ බෝ කොළ රටාවකින් යුක්ත ය.

උතුරු බිත්තියේ අනෙක් සිතුවම් තීරු තුනෙන් දැක්වෙන්නේ වෙස්සන්තර ජාතකයයි. එහි පළමුවන තීරුවේ වම් කෙළවරින් ඇරඹෙන කතාව විකාශනය වන්නේ දකුණටය. වම්පසින් ඇරඹෙන දෙවන තීරුව වමේ සිට දකුණට විහිදී ඇත. තුන්වන තීරුවේ දී කතාව පෙළගැසෙන්නේ දකුණේ සිට වමටය. කතාව අවසන් වන්නේ බිම් මට්ටමට නුදුරුව පිහිටි එම තීරුවේ වම් කෙළවරින් ය.

පළමුවන තීරුවේ මුලින්ම ඇත්තේ වෙස්සන්තර රජු වැසියෙකුට යමක් සුදානම් කරන දර්ශනයකි. මෙහිදි වෙස්සන්තර රජ මාළිගාව ඉදිරියේ ඇති ආසනයක් මත අසුන්ගෙන සිටින අතර වැසියා සිටින්නේ රජු ඉදිරියේ සිටගෙනය. එම දර්ශනයට පසුව එලෙස ප්‍රදානයක් ලබා ගත් මිනිසුන් තිදෙනෙක් ඒවා හිස තබාගෙන සැරයටි වාරුවෙන් ගමන් ගන්නා ආකාරය දක්වා ඇත. මීළඟට එන දර්ශනයේ ද ඇත්තේ රජු දාන වස්තුවක් පිරිනමන අවස්ථාවකි. එහි රජු සිටගෙන සිටින අතර වැසියා ද රජුට වම් පසින් සිටගෙන සිටී. මෙම ජවනිකාවට පසුව දක්වා ඇත්තේ ඇලි ඇතු දන්දීමට රැගෙන යන අවස්ථාවය. එහි දැක්වෙන ඇලි ඇතු මනාව සරසා ඇත. එම ඇතුගේ හොඬය ළඟ සිටගෙන සිටින්නා එය අල්ලාගෙන සිටිනවා විය හැකිය. ඔහුට ඉදිරියෙන් තවත් මිනිසුන් දෙදෙනෙක් ද දැකිය හැකි ය.

වෙස්සන්තර රජු මන්ද්‍රී දේවිය සහ දරු දෙදෙනා (ජාලිය, ක්‍රිෂ්ණජිනා) අස්රියේ නැඟී වංගගිරිය බලා යනු ඊළඟ ජවනිකාවෙන් දක්වා තිබේ. මෙහි දී එම පිරිස රථය තුළ සිටින බව දක්නට ලැබේ. රථයේ රෝද මැකී ගොස් ඇති අතර අශ්වයා ද දර්ශනය වන්නේ යාන්තමින් ය.

මෙම ජවනිකාවට පසුව එම තීරුවේ සිතුවම් සියල්ල මැකී ඇත. වම්පසින් ඇරඹෙන දෙවන තීරුවේ මුල් කොටස ද හඳුනාගත නො හැකි තරමට මැකී ගොස් ය. එහි ඉතිරිව ඇති මුල්ම දර්ශනයෙන් දැක්වෙන්නේ ඔටුණු පැළඳි පුද්ගලයෙකු සහ මහල් දෙකකින් යුත් මන්දිරයකි. එම දර්ශනයෙන් නිරූපණය වන්නේ චෙතිය රජු විසින්